සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 07 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය

නම / විභාග අංකය ................................ කාලය: පැය 02 යි.

සැලකිය යුතුයි.

- සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.
- I කොටසේ ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයා , II කොටස පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.

- අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල අක්ෂර වින්‍යාසය නිවැරදි පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) 1) අධිකරන 2) අදිකරණ 3) අදිකරන 4) අධිකරණ

(2) 1) තම්බපණ්නි 2) තම්බපණ්ණි 3) තම්බපන්ණි 4) තම්හපන්ණි

(3) 1) බික්ෂුණි 2) භික්ෂුනී 3) භික්ෂුණී 4) භික්සුනී

(4) 1) තෘෂ්ණාව 2) තෘශ්ණාව 3) තෘෂ්ණාව 4) තෘෂ්නාව

(5) 1) ගණ්ඨාරය 2) ගන්ඨාරය 3) සණ්ටාරය 4) සන්ටාරය

(06) සඤ්ඤක අක්ෂර පමණක් යෙදී ඇති වරණය තෝරා යටින් ඉරක් අඳින්න.

1) කීන, අඹ, කුඹුක්, ජම්බු
2) වඳ, තුඹ, රඟ, මඬල
3) කඳ, නුඹ, සඳ, නුබ
4) ගඟ, කරන, වුණු, ළදලු

(07) සෑම පදයක ම <u>මහප්‍රාණ</u> අක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1) ශ්‍රේෂ්ඨ, විශිෂ්ට, ප්‍රවීණ, මධුර
2) ආරක්ෂක, භාවිතය, අර්ථය, ආරූඪ
3) පාඨශාලාව, ප්‍රතිඵල, වර්ධනය, සම්භාෂණ
4) අභය, මුඛය, නරඹන, ශ්‍රද්ධාව

(08) සෑම පදයක ම <u>මූර්ධජ</u> අක්ෂර ඇතුළත් වරණය කුමක් ද?

1) ණය ගැති, පිළිවෙළ, පුරාණ, පාෂාණ
2) මතය, භාෂාව, ළහිරු, සහිත
3) රත්මල, විශේෂය, සංකේතය, පහන
4) අවසර, විවේක, සවස, දසන්

(09) "සහස්‍රකය" යන වචනයෙහි අර්ථය දැක්වෙන වරණය තෝරන්න.

1) පන්සියයකින් සමන්විත.
2) දහයකින් සමන්විත.
3) සියයකින් සමන්විත.
4) දහසකින් සමන්විත.

(10) විරුද්ධ අර්ථය ප්‍රකාශ නොවන පද ඇතුළත් පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) උත්තම - අධම
2 ජාතික - විජාතික
3) අවමාන - අසමාන
4) උස් - මිටි

(11) "ප්‍රාකාරය " යන පදයට සුදුසු සමාන පදය සහිත වරණය තෝරන්න.

1) නිවස 2) තාප්පය
3) පව්ව 4) අහස

(12) මිශ්‍ර ක්‍රියාවක් හා පූර්වක් ක්‍රියාවක් සහිත වරණය තෝරන්න.

1) හඬවයි, නටමින්
2) බලයි, පැන
3) නටමින් , බලා
4) කර, කවමින

(13) ප්‍රථම පුරුෂ නාම පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1) ගෙවිලිය, අම්බරුවෝ ,වෛද්‍යවරයා, ඔහු
2) ළමයා, සොයුරා, අපි, තෝ
3) තෙපි, ඇය, ඔහු, නුඹ
4) සේවකයා, මම, කුරුල්ලා, ඔහු

- පහත සඳහන් උක්ත පද අනුක්ත පද බවට හරවා හිස්තැන්හි ලියන්න.

උක්ත පද අනුක්ත පද

(14) සමනළයෙක් ............................................................

(15) ඔවුහු ............................................................

- පහත සඳහන් පදවලට විශේෂණ පද යොදා නැවත ලියන්න.

(16) වතුර - ..................................

(17) කැගසති - ....................................

- පහත සඳහන් වාක්‍යාංශ වෙනුවට යෙදිය හැකි තනි පද ලියන්න.

(18) දිය යට යන - .................................
සිතුවම් අඳින ලද වස්ත්‍රය - .................................

(19) පහත සඳහන් කවියේ ඉතිරි පද දෙක ලියා කවිය සම්පූර්ණ කරන්න.

ගලක් පළා ගලක් දුටිම්
එ ගල පළා රිදී දුටිම්
........................................
......................................

(20) පහත සඳහන් නිර්මාණය කරන ලද ලේඛකයාගේ නම ලියා දක්වන්න.

සසර වසන තුරු - නිවන් දකින තුරු
පින් කෙත හෙළ රන් දෙරණේ යළි උපදින්නට
හේතු වාසනා වේවා - හේතු වාසනා
ලේඛකයාගේ නම - .................................... (ලකුණු 2 x 40 )

## II කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස, ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනයා පිළිබඳ තොරතුරු රැස්කර පොත් පිංචක් සකස් කිරීම සිදු කළේ යැයි සිතා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනයා වාසය කරන ප්‍රදේශ දෙකක් ලියන්න.
2) අභිකුණ්ඨික ජනයාගේ පැල්පත්වල හැඩය කෙබඳු ද?
3) ඔබ සොයාගත් කරුණු අනුව අභිකුණ්ඨික ජනයාගේ විවාහ මංගල උත්සවයක දී මනාල යුවළ ට ලැබෙන තෑගි දෙකක් ලියා දක්වන්න.
4) පොත් පිංච සකස් කිරීමේ දී ඔබට මතු වූ ගැටලු දෙකක් ලියන්න.
5) පොත සකස් කිරීමට උදව් ලබාගත් ආකාර දෙකක් ලියන්න. (ලකුණු 2 ×5 = 10 )

(02) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු නිර්මාණාත්මක රචනාවක් ලියන්න.

1) මා කියවූ හොඳ ම පොත.
2) මා නිවාඩු කාලය ප්‍රයෝජනවත් ලෙස ගත කළ හැටි.
3) යහපත් මිනිසුන්ගෙන් සමාජයට සිදුවන මෙහෙය.
4) ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යවලින් පරිසරයට වන හානිය අවම කර ගනිමු.
5) ක්‍රීඩාව නිරෝගී ජීවිතයකට වැදගත් වේ. (ලකුණු 20)

(03) ඔබ පාසලේ පැවැත්වීමට තීරණය කර ඇති ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න. (ලකුණු 10)

(04) පෙළ පොත ඇසුරින් අසා ඇති පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) "පමා වීමට කිසියම් වුවමනාවක් නැහැ"
   - i) මෙසේ කීවේ කවුද?
   - ii) කා හට ද? (ලකුණු 02)

2) "අම්බරුවන් පිට කමත් කරන්න"
   - i) මෙසේ කීවේ කවුද?
   - ii) කා හට ද? (ලකුණු 02)

3) "තමන් වහන්සේගේ අතවැස්සන් ලවා මගේ තල ගන්නා සේකැ"
   - i) මෙසේ කීවේ කවුද?
   - ii) කා හට ද?
   - iii) උපුටාගත් පාඩමේ නම කුමක් ද? (ලකුණු 03)

4)
   - i) කෝමල රේඛා පද්‍ය සංග්‍රහය කාගේ නිර්මාණයක් ද?
   - ii) " දිලිහි දිලිහි ආකාසේ බබළන මල් තාරකා"
     ඉහත කවි පදයේ ඇතුළත් රූපකය ලියන්න.
   - iii) අනුස්මරණය යන වචනයෙහි අර්ථය ලියන්න. (ලකුණු 03)

(05) අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු කෙටියෙන් සපයන්න.

ඒ අමුතු වලාකුළ වූයේ ගල් වැස්සක් මෙන් වැටුණු පළඟැටියන් ගෙන් සැදුණු වලාකුළක් විය. උන්ගේ සිරුරු හිරු වසාගෙන ඝන අන්ධකාරය ඇති කළේ ය. උන්ගේ තුනී විශාල පියාපත් විනිවිද පෙනෙන කාන්තියකින් දිලිසෙන්නට විය උන්ගේ පියාපත් වලින් නැගෙන පීරි ගානක් වැනි අමිහිරි ඝෝෂාවෙන් මුළු පරිසරය ම පිරී ගිය අතර ඔවුහු ගල් වැසි සහිත කුණාටුවක් මෙන් නොනවත්වා ම ඝෝෂා කරමින් පොළොවටත් ගෙතුළටත් වැටුණහ.

1) මෙහි සඳහන් වලාකුළ සෑදී තිබුණේ කුමන සතුන්ගෙන් ද?
2) ඝන අන්ධකාරය ඇතිවූයේ කෙසේ ද?
3) පළඟැටියාගේ පියාපත්වල ස්වභාවය කෙබඳු ද?
4) ඡේදයේ සඳහන් උපමාවක් ලියා දක්වන්න.
5) පහත සඳහන් පදවල විරුද්ධාර්ථ පද ලියන්න.
   i) මිහිරි -
   ii) අන්ධකාරය - (ලකුණු 2 ×5 = 10 )